# රත්නපුර ප්‍රාදේශීය සභාව 2023.01.12 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2023.01.12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සදහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03 | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | අයි.ඩබ්ලිව් අකිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | යූ.කේ නන්දාවති මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | ගෝපාල් තම්බිරාජා මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | කේ.ඒ.ජයරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | වජිරා නන්දනී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | උදය කුමාර් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ලීලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | |
|---|---|---|
| 01. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | ඩී.නිලන්ති දිපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.12.09 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු රංජිත් ධර්ම කීර්ති මහතා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී රණවක කළුආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

නැත

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

I.ලුණුවැල්ල, ගිලීමලේ ලිපිනයේ පදිංචි ඩී.වී.බුද්ධික ජයරත්න මහතා (ජා.හැ.ප 200234100830) 2023.01.03 දින සිට රත්නපුර ප්‍රාදේශිය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරක සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීම සඳහා කටයුතු කිරීමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී සමන් පාලිත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

II. 2023 වර්ෂය සඳහා කාරක සභා සඳහා සාමාජිකයින් පත් කරගැනීමේ යෝජනාව

- **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව**
  - ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා
  - ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතා
  - ගරු මන්ත්‍රී කමනි සේනාධිර මහත්මිය

  සුදුසුයැයි ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කර ස්ථිර කරන ලද අතර, **ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා** සුදුසුයැයි ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා විසින් යෝජනා කර ස්ථිර කරන ලද අතර, **ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී** මහත්මිය සුදුසුයැයි ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා යෝජනා කර එතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- **නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව**
  - ගරු උප සභාපති ජානක පුෂ්පකුමාර මහතා ,
  - ගරු මන්ත්‍රී ප්‍රියන්ත පෙරේරා මහතා,
  - ගරු මන්ත්‍රී ඉන්ද්‍රාණී මැණිකේ මහත්මිය,
  - ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා,
  - ගරු මන්ත්‍රී නිහාල් අමරසිංහ මහතා

සුදුසුයැයි ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතා විසින් යෝජනා කර එතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- **කාර්මික සේවා කාරක සභාව,**
  - ගරු මන්ත්‍රී රණවක කළු ආරච්චි මහතා,
  - ගරු මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතා,
  - ගරු මන්ත්‍රී සමන්පාලිත විජේරත්න මහතා,
  - ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා

  සුදුසු යැයි ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතා විසින් යෝජනා කර ස්ථිර කළ අතර,
  ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා සුදුසුයැයි ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී මහත්මිය විසින් යෝජනා කර එතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- **පරිසරය හා පහසුකම් කාරක සභාව**
  - ගරු මන්ත්‍රී පත්මා නන්දනී මහත්මිය,
  - ගරු මන්ත්‍රී ලීලානි චන්ද්‍රතිලක මහතා,
  - ගරු මන්ත්‍රී දමිත් අල්ගම මහතා,
  - ගරු මන්ත්‍රී මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා,
  - ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා

සුදුසුයැයි ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

III.වැලිගම ප්‍රාදේශිය සභාවේ කසළ කළමණාකරණ වැඩපිළිවෙල පිළිබඳව අධ්‍යයනය සඳහා නිරීක්ෂන චාරිකාවක් වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන් හා කාර්යය මණ්ඩලය යොමු කිරීම සුදුසු බව විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

iv.ර/කැටවල විද්‍යාලයේ දැනට 9 ශ්‍රේණිය දක්වා පංති පවත්වාගෙන යනු ලබන අතර, එය අ.පො.ස(සා.පෙළ)දක්වා දීර්ඝ කිරීම සඳහා යෝජනා කර ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව , එම යෝජනාව ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**v.**රත්නපුර ප්‍රාදේශිය සභාවට අයත් RS-1628 අංක දරණ බැක්හෝ ලෝඩර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා සේවා නියෝජිතායනයෙන් ඉදිරිපත් කරන ලද රු:-1,264,540.00 ක ඇස්තමේන්තුව අනුමත කර ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව සියළුම මන්ත්‍රීවරුන්ගේ යෝජනාව වූයේ මෙම බැකෝ යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් ප්‍රාදේශීය සභාවේ අරමුදල් නොයොදා පළාත් සභාවෙන් මුදල් ලබාගෙන අළුත්වැඩියාව සිදුකිරීමට කටයුතු සිදුකිරීම සුදුසු බවයි.එම තීරණය සුදුසුයැයි ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

VI. ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගෙන අඩු ආදායම්ලාභී පහත සඳහන් පවුල් වෙනුවෙන් සෙවිලි තහඩු ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී කරුණාරත්න මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- ශ්‍රී පලාබද්දල, රත්නපුර ලිපිනයැති එෆ්.ඒ.ප්‍රේමචන්ද්‍ර මහතා වෙතසෙවිලි තහඩු ලබා දීම- ගරු සභාපතිතුමා
- දෙහෙනකන්ද කොට්ඨාශයේ 164/F දෙහෙනකන්ද ග්‍රාම සේවා නිලධාරී වසමේ පදිංචි කේ.මහේශ්වරී මහත්මිය හා වී.තිරෝපදී මහත්මියට සෙවිලි තහඩු 15 බැගින් ලබාදීම. - ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා
- දකුණු ගිලීමලේ මැදගම පදිංචි ඒ.ඒ.සුනිල් මහතාට සෙවිලි තහඩු ලබා දීම - ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා

VII.රත්නපුර ,හිදැල්ලන,මලංගම, පලවන පටුමග ප්‍රදේශය "රජමල් උයන " ලෙස නම්කිරීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

VIII.2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සුදුසු බව ගරුසභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**IX.**2022 වර්ෂයේ හිඟ ආදායම් ආදායම් එකතු කිරීම 2023.03.31 දිනට අවසන් කිරීම සඳහා සේවයේ යොදවා ඇති විදුලි කාර්මික අනුර දිප්ති කුමාර මහතාට හා සෞඛ්‍ය කම්කරු සුසිල් කුමාර මහතා යෙදවීමටත් ඒ සඳහා ගමන් වියදම් දීමනාවක් /සංයුක්ත දීමනාවක් ගෙවීමට යෝජනා කළ නමුත් , මේ වෙනුවට රු:-7500.00ක දීමනාවක් මසකට ලබා දීමටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවත් , මෙම ආදායම් එකතු කිරීම වාර්තා මාසිකව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට හා මහා සභාවට ඉදිරිපත් කිරීමටද ඔවුන් බැඳී සිටිය යුතු බව මහා සභාව එකග වූ අතර, එම යෝජනාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**X.**ගල්ලැල්ල තේ වත්තේ පැල සිටුවීමට පෙර පස සකස් කර භූමිය සුදානම් කිරීමේ කාර්යයට මිළ ගණන් කැඳවා බදු දීමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව , එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2022.12.30 වන දින මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05:01 හදිසි යෝජනා**

i. 2023 මාර්තු 31 දිනට පෙර වරිපනම් සමීක්ෂණ කටයුතු අවසන් කිරීම සඳහා කාර්යාලයේ නිලධාරීන් ට පැවරී ඇති රාජකාරී සමඟ හැකියාවක් නොමැති කම හේතුවෙන් 2023.03.31 දිනට මෙම සමීක්ෂණ කටයුතු අවසන් කළයුතු නිසාත් දියුණුගම් ප්‍රදේශ ලෙස ගැසට් කර ඇති ග්‍රාම නිලධාරී වසම් 06 හි සමීක්ෂණ කටයුතු සිදුකිරීමට එක් එක් ග්‍රාම නිලධාරී වසමකින් ග්‍රාම නිලධාරීන් විසින් හඳුනාගත් පුද්ගලයන් එක් වසමකින් එක් අයෙක් හෝ දෙදෙනෙක් යොදවා ගැනීම හා බෙදා දෙන අයදුම්පත් නැවත කාර්යාලයට ගෙනවිත් බාරදීම වෙනුවෙන් ඔවුන්ට එක් අයුම්පතක් සඳහා රු:-30.00ක මුදලක් ගෙවීම් කිරීමටත් සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

ii. කාන්තා හා ළමා කටයුතු පිළිබඳ කාරක සභාව සඳහා මෙම අවස්ථාවේ සභාවේ සිටින මන්ත්‍රී ධූර දරණ කාන්තා මන්ත්‍රීවරියන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් පත් කර ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී කමනි සේනාධීර මහත්මිය යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී කරුණාරත්න මහත්මිය
- ඉන්ද්‍රාණී මැණිකේ මහත්මිය
- පත්මා නන්දනී මහත්මිය
- ලිලානි චන්ද්‍රතිලක මහත්මිය
- කමනි සේනාධීර මහත්මිය

එම යෝජනාව ගරු මන්ත්‍රී ලිලානි චන්ද්‍රතිලක මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**I.ගරු මන්ත්‍රී පත්මා නන්දනී මහත්මිය**

අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලැබුණා අපිත් කිහිප විටක් අයවැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා ඒසේ කළේ සාම්ප්‍රදායික විපක්ෂයේ කාර්යය භාර්යයක් ලෙස නොවෙයි. ඒ තැනදි ඔබ තුමා කිව්වා සුළු සුළු ටික හරි වීථි පහන් ටික හරි මේ සැරේ ලබාදෙනවා කියලා . නමුත් කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ට මෙම වීථි පහන් ටික හරියාකාරව ලැබිලා නැහැ. ඒ වගේම පසුගිය කාලයේ වර්ෂාව හේතුවෙන් පාරවල් අබලන් වීමට පත්වුණා ඒතන්දිත් අපි ඉල්ලීමක් කළා ශ්‍රමදානයක් හෝ දාලා අබලන් වූ මාර්ග ටික සකස් කරදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට ,දෙහෙන කන්ද හේන්යාය පාර හා දෙහෙන කන්ද අමුණුතැන්න මාර්ගය ගමන් කිරීමට බැරි තත්වයටම අබලන් වී තිබෙනවා .ඒම පාරවල් දෙක හදන්න ක්‍රමවේදයක් සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරනවා.

සභාව පත්වෙලා දෙවන සභා වාරයේදීම මම ඉල්ලීමක් කළා සභාවට අයත් සුසාන භූමි , ක්‍රීඩා පිටි වෙන්කරලා මැනුම් කටයුතු සිදුකරන්න කියලා නමුත් ඒවා සිදුවෙලා නැහැ. දැන් මිනිස්සු ඒම භූමි අනවසරයෙන් අල්ලා ගෙන අයිතිකරගෙන තිබෙනවා. මුලදී අපි ආධුනිකයි නමුත් අපි දැන් දන්නවා ප්‍රාදේශීය සභාවකින් විය යුතු දේවල් පිළිබඳව , මුදල් කාරක සභාවේ විශාල මුදල් අනුමත කරනවා. නමුත් කුඩා දේවල් පිළිබඳව නොසළකා හරලා තිබෙන බව ඒතුමිය පැවසුවේය. මෙවැනි දේ කියන්නේ වැරදි කිම සඳහා නොව ඉදිරියට ඒන කෙනෙකුට හෝ නිවැරදි වීම සඳහා බව ඒතුමිය පැවසුවේය.

මේ වන විට මැතිවරණයක් ප්‍රකාශයට පත්කර තිබෙනවා .ජනතාව අතරට අපි යන විට මේ අවුරුදු පහට මොනවද කරලා තියෙන්නේ කියලා ජනතාව ඇහැව්වොත් කියන්න දෙයක් නැහැ. හිස් මිනිසුන් පිරිසක් කියලයි මට නම් හිතෙන්නේ.

මේ සභාවට ඉදිරියේදී කවුරුන් පත්වෙයිද කියා දන්නේ නැහැ නමුත් අවසානය තෙක් සභාවෙන් හොද දෙයක් සභාව තුළින් සිදු කළයුතු බව ඒතුමිය සඳහන් කළේය.

**ii.ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා**

අමුණු තැන්න අම්බලන් යාය ප්‍රදේශයේ වසර දහයක් පමණ තිස්සේ ජලය ලබාගන්නා බට ලයින් එකක් සම්බන්ධව ගැටළුකාරී තත්වයක් ඇති වී තිබෙනවා. මේ සම්බන්ධව සභාවෙන් අදාල පුද්ගලයා වෙත මෙම බටලයින් එක ඉවත් කරන්නේනම් එය වෙනත් ස්ථානයකින් සකස් කරදෙන ලෙස දන්වා ලිපියක් යවා ඇති නමුත් තවමත් එම පුද්ගලයා විසින් එය සකස් කර නොමැති බවත්, මෙම ගැටළුව විසඳීම සඳහා කටයුතු කරන ලෙස එතුමා ඉල්ලීමක් කළේය.

**iii.ගරු මන්ත්‍රී තමරා සුභාෂිණී කරුණාරත්න මහත්මිය**

රංජිත් මන්ත්‍රීතුමා සඳහන් කළ අමුණුතැන්නේ ජල ගැටළුව සම්බන්ධව ගරු මන්ත්‍රීතුමිය අදහස් ප්‍රකාශ කරමින් සඳහන් කර සිටියේ අදාල ස්ථානයේ කාණුවක් කපා බට ලයින් එළිමට හැකියාවක් නොමැති බව

නිරීක්ෂනය වන බැවින් මෙම ගටළුව පොලීසිය දක්වා ගොස් ඇති නිසාත්, තවමත් විසදී නොමැති නිසාත් මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ගැටළුව විසඳීම සඳහා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

**iv.ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා**

ගියවර සභාවට මට එන්න බැරි වුනා වේවැල් කැටිය හා පහළ අමුතැන්න මාර්ගය ඉතාමත් අබලන් තත්වයක පත් වී තිබෙනවා. ජලය ගලාගෙන යන්නේ පාර පුරා පාරේ බයිසිකලයකින්වත් ගමන් කළ නාහැකි තත්වයක්ට පත්වෙලා තිබෙනවා. ජේ.සී.බී.යන්ත්‍රයක් හෝ යොදවා කාණු පද්ධතිය ගොඩ දා මෙම මාර්ගයේ ගමන්කළ හැකි පරිදි සකස් කරදෙන සෙ එතුමා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

සමෘද්ධි ලාභින් සඳහා ගැටළු කිහිපයක් ඇවිත් තිබෙනවා. සමෘද්ධි කාර්යාලයේ ප්‍රධාන නිලධාරීතුමිය කියා සිටිනවා කෙනෙක් සමෘද්ධි ප්‍රතිලාභ ගන්න ගිය අවස්ථාවේදී උදය කුමාර් මන්ත්‍රීතුමාගෙන් ලිපියක් රැගෙන එන ලෙස කියා තිබෙනවා.නිලධාරියෙකු ලෙස එසේ පැවසීම සුදුසු නොවන බව එතුමා පැවසුවේය.

වතුකරයේ ජනතාව ආර්ථික මට්ටමින් ඉතාමත් පහළ මට්ටමකට පත්ව තිබෙනවා. මම පැවසුවා මෙවර අයවැයෙන් හෝ වගා කිරීමේදී සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා අවශ්‍ය දැල් ජනතාවට ලබාදෙන්න කියලා. නමුත් තවමත් එසේ නොවන බව එතුමා පැවසුවේය. අඩි දහයේ දහයේ වගා ආවරණ දැල් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

**v.ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා**

හෙට දවසේ කුමක් වුවත් අපි සියළුම දෙනා සතුටින් මේ ගමන යායුතු බවත් , අවසන් කළ යුතු බවත් එතුමා පැවසුවේය. සමෘද්ධි නිලධාරී විසින් දුප්පත් ජනතාවට කළ අසාධාරණය වෙනුවෙන් සාධාරණයක් ඉටු විය යුතු බවත්, සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමා නිවැරදියයැයි කිහිප දෙනෙකු විසින් පවසන බවත්, නමුත් මෙම නිලධාරියා වසමෙන් මාරු කර පරික්ෂණය සිදුකළ යුතු බවත්, ඒ පිළිබඳව සමෘද්ධි කොමසාරිස් තුමා වෙත දැනුවත් කරන ලද බවද එතුමා පැවසුවේය.

**vi. ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා ගරු සභාපතිතුමා**

අද දින මහා සභාවට පැමිණි සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට හා තුමියන්ලාටත්, ලේකම් තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුති වන්ත වන බවත්, සභාව කවදා විසිරුවයිද කියා දන්නේ නැහැ. රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග සියල්ලම සකස් කර අවසන් කිරීමට තමයි මගේ බලාපොරොත්තුව තිබුණෙත් නමුත් රත්නපුර දිස්ත්‍රික්කයට මාර්ග අමාත්‍යවරු හිටියත් ඒවා සිදු කර ගැනීමට හැකියාවක් ලැබුණෙ නැහැ.

ඇතැම් අය සභාවට පැමිණි සෑම අවස්ථාවේදී මට ලැබුණෙ නැහැ හා නොරිස්සුම ස්වාභාවයෙන් කතා කරනවා. නමුත් මම නම් කියන්නේ ලැබෙන දෙයින් සෑහිමකට පත්වෙලා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පැවසුවේය. මැද මාවතේ ගියාම සියළුම ගැටළු විසඳෙන බව එතුමා පැවසුවේය. සභාවෙන් සියළුම දේ ඉටුකර ගැනිමට හැකියාව ලැබුන් නැහැ. නොයෙකුත් ගැටළු ඇතිවීම හේතුවෙන් .අවුරුදු පහත් තිස්සේ සිංහළ දෙමළ ක්‍රිස්ත්‍රියානි සියළුම දෙනා එක්ව අවුරුදු පහක් තිස්සේ එක්ව කටයුතු කළා. මම කවදාවත් පුද්ගලයෙකු හැටියට තීරණ ගන්නේ නැහැ මතවාද විවිධ වෙන්න පුළුවන් නමුත් සියළුම දෙනා එක්ව සිටිය යුතු බවත්, කවුරු ජයග්‍රණය කළත් එක්ව කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා පැවසුවේය.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**